2017 අප්‍රේල් 10 වැනි දිනය වන විට ADB.org හි දක්වා තිබූ ඉංග්‍රීසි පිටපත මත මෙම පරිවර්තිත ව.ද.ප පාදක වේ.

ADB ASIAN DEVELOPMENT BANK

**ශ්‍රී ලංකාවඃ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය ඇපකාර ආයතනය**

| | |
|---|---|
| ව්‍යාපෘති නාමය | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය ඇපකාර ආයතනය |
| ව්‍යාපෘති අංකය | 50349-002 |
| රට | ශ්‍රී ලංකාව |
| ව්‍යාපෘති තත්වය | යෝජිත |
| ව්‍යාපෘති වර්ගය/ සහායේ ප්‍රකාරතාව | ණය<br>තාක්ෂණික සහාය |
| අරමුදල් මූලාශ්‍රය / වටිනාකම | **ණය: සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය ඇපකාර ආයතනය**<br>සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් — ඇ.එ.ජ ඩොලර් මිලියන 100.00<br>**තාක්ෂණික සහාය: සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය ඇපකාර ආයතනය**<br>මූල්‍ය අංශ සංවර්ධන හවුල්කාරිත්ව විශේෂිත අරමුදල — ඇ.එ.ජ ඩොලර් 500,000.00<br>තීරණය කල යුතු — ඇ.එ.ජ ඩොලර් 500,000.00 |
| ක්‍රමෝපාය න්‍යාය පත්‍රය | සමස්ත ආර්ථික වර්ධනය |
| වෙනස්වීමේ තීරක | දැනුම් මූල විසඳුම්<br>හවුල්කාරිත්වය<br>පුද්ගලික අංශ සංවර්ධනය |
| ක්ෂේත්‍රය/ උපක්ෂේත්‍ර | **මූල්‍ය-** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මූල්‍යකරණය සහ ලීසිං |
| ස්ත්‍රී/පුරුෂ සමානතාවය සහ මුඛ්‍යධාරා වර්ගීකරණයන් | ඇතැම් ස්ත්‍රී/පුරුෂ අංග අඩංගුය |

| | |
|---|---|
| විස්තරය | යෝජිත ඇ-එ-ජ-ඩොලර් මිලියන 100 ණය මුදල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට වාණිජ ණය සඳහා ප්‍රවේශය ලබාදීමට නව බැංකු නොවන මූල්‍ය ආයතනයක් වන 'සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය ඇපකාර ආයතනය' පිහිටුවීමට සහාය ලබා දෙයි. |
| ව්‍යාපෘති සාධාරණීකරණය සහ දේශීය/ කාලාපීය ක්‍රමෝපාය කෙරෙහි ඇති සම්බන්ධය | සංවර්ධන අභියෝගය. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඉතා වැදගත්ය. මේ මගින් රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් 52% කට දායකත්වය ලබාදේ. සේවා නියුක්තියෙන් 45% ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආවරණය කරන බැවින් දිළිඳුබව අඩු කිරීමටද ඉතා වැදගත්ය. සුරක්ෂිත ණය ලබාදීමේ නීති, ණය තොරතුරු කාර්යාංශය, සහ දේපල රෙජිස්ට්‍රරය වැනි වැදගත් වෙළෙඳපොල යටිතල පහසුකම් පැවතියත් තවමත් මූල්‍යකරණය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අරගලයක යෙදී සිටී. 2011 ලෝක බැංකු සමීක්ෂණයේදී හඳුනාගත් පරිදි ශ්‍රී ලාංකික ආයතන වලින් 30% ක් මූල්‍යකරණය සඳහා පවතින දුර්වල ප්‍රවේශය ප්‍රධාන බාධකයක් ලෙස සලකන අතර එම ප්‍රතිශතය සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් 29 ක් අතර ඉහළ සිට හතරවැනි මට්ටමේ පවතී. ශ්‍රී ලාංකික බැංකු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට ණය ලබාදීමට පසුබට වීමට ප්‍රධාන හේතුව ලෙස දක්වන්නේ ඔවුන් ඇප මත ණය දීමේ යෙදී සිටීමයි. නමුත් බොහෝ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට එවැනි ඇප තැබීමට හැකියාවක් නොමැත.<br><br>එවැනි වෙළෙඳපොල අසමත්වීම් ආමන්ත්‍රණය කිරීමට රජය වසර ගණනාවක් පුරා විවිධ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය ඇපකර යෝජනාක්‍රම හඳුන්වාදී ඇත. කෙසේ වෙතත් ඒවායෙන් කිසිවක් අපේක්ෂිත ප්‍රතිඵල ගෙනදීමට අසමත් විය. වෙළෙඳපොල සහභාගීකරුවන් විසින් මන්දගාමී හිමිකම් ක්‍රියාත්මක කිරීම්, සීමා සහිත ඇපකර ආවරණ, සහ ඉහළ වාරික (ඇමුණුම 3) ගෙනහැර දක්වයි.<br><br>ප්‍රධාන පාර්ශවකරුන් අතර ප්‍රතිපත්ති සංවාදය. විස්තරාත්මක විසඳුමක අවශ්‍යතාවය හඳුනාගනිමින් 2016 රාජ්‍ය අයවැය ප්‍රකාශනයෙන් ණය ඇපකර ආයතනය පිහිටුවීමට රජය විසින් යෝජනා කල අතර ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඉල්ලා සිටින ලදී. වෙළෙඳපොල ඉල්ලුම තක්සේරු කිරීමට, අන්තර්ජාතික ප්‍රශස්ත භාවිතයන් පර්යේෂණය කිරීමට, සහ ව්‍යාපාරික සැලැස්ම සැකසීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් හැකියා සංවර්ධන තාක්ෂණික සහාය වැඩසටහනක් අරඹන ලදී. ආසියානු සංවර්ධන බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය ව්‍යාපෘතිය යටතේ පිහිටුවන ලද පාලන කමිටුව මෙම වැඩ විමර්ශණය කල අතර කෙටුම්පත් කරන ලද අවසන් වාර්තාව 2016 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. අගමැති තුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය කමිටුව විසින් 2016 ඔක්තෝබර් මාසයේදී ආසියානු සංවර්ධන බැංකුවේ යෝජනාව අනුමත කරන ලදී. එසේම මුදල් අමාත්‍යවරයා විසින් 2017 රාජ්‍ය අයවැය කතාවේදී ආයතනය පිහිටුවීමට තිබෙන සැලසුම් ඉස්මතුකර දක්වන ලදී.<br><br>ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රවේශය. පසුගිය දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය ඇපකර යෝජනාවලිය තුළින් උගත් පාඩම් (ඇමුණුම 3) සහ අන්තර්ජාතික ප්‍රශස්ත භාවිතයන් (ඡේදය 4) මත දැඩිව පදනම් වෙමින් මෙම යෝජිත ප්‍රවේශය කෙටුම්පත් කරන ලදී. නව ආයතනය හොඳින් අරමුදල් සපයන ලද, කාර්යක්ෂමව කළමනාකරණය කරන ලද, මූල්‍යමය වශයෙන් ධරණීය, දේශපාලනික බලපෑම් වලින් ස්වාධීන, ඉහළ මට්ටමේ සාංගමික යහපාලනයක් යටතේ මෙහෙයවෙන, සහ මහා බැංකුවේ නියාමනය සහ සුපරීක්ෂණයට යටත්වන |

| | |
|---|---|
| | ආයතනයක් විය යුතුය. ආයතනයේ ආරම්භය ලාභදායිත්වය සහ ශක්තිමත් ණය ශ්‍රේණිගත කිරීමක් සහතික වන ලෙස ගතානුගතික විය යුතුය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා පොදු ණය ඇපවීමේ යෝජනාවලිය කෙරෙහිවූ ලෝක බැංකුවේ මූලධර්ම වලට මෙම යෝජිත ප්‍රවේශය අනුගාමී වෙයි (ඇමුණුම 4).<br><br>මූල්‍යකරණ සහාය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහාය. පුද්ගලික ආයෝජන උත්ප්‍රේරණය කිරීම සහ රාජ්‍ය ආයෝජන වල කාර්යක්ෂමතාවය ඉහළ නැන්වීම යන ආසියානු සංවර්ධන බැංකුවේ රාජ්‍ය හවුල්කාරිත්ව ක්‍රමෝපායේ කුලුනු තුනෙක් එකක් සමඟ මෙම යෝජිත ණය සමගාමී වේ. තවදුරටත්, ඇ-එ-ජ-ඩොලර් මිලියන 100 ක ණය සහ ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍යකරණය දියුණු කිරීමේ තාක්ෂණික සහාය ප්‍රදානයන් දෙකක් යන දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති තුනක් ආසියානු සංවර්ධන බැංකුව සතුව පවතී. |
| බලපෑම | ශ්‍රී ලංකා ආර්ථිකයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලින් ලබාදෙන ඉහළ නැන්වූ දායකත්වය. |
| ප්‍රතිඵලය | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට මූල්‍යකරණය සඳහා පවතින ඉහළ නැන්වූ ප්‍රවේශය. |
| නිමැවුම | පිහිටුවන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය ඇපකාර ආයතනය සඳහා සාංගමික සහ නියාමන ආකෘතිය<br><br>මූල්‍යමය වශයෙන් ධරණීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය ඇපකාර ආයතන මෙහෙයුම්<br><br>ව්‍යාපෘති පවතින වැඩිදියුණුවූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය ඇපකරණය |
| භූගෝලීය පිහිටීම | |

ආරක්ෂණ වර්ගීකරණයන්

| | |
|---|---|
| පාරිසරික අංගය | FI |
| ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම | FI-C |
| ආදිවාසී ජනතාව | FI-C |

පාරිසරික සහ සාමාජයීය අංග පිළිබඳ සාරාංශය

| |
|---|
| පාරිසරික අංගය |
| ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම |
| ආදිවාසී ජනතාව |

**පාර්ශවකරුවන් සමග සන්නිවේදනය, සහභාගිත්වය සහ උපදේශනය**

| |
|---|
| ව්‍යාපෘති සැලසුම්කරණ කාලය අතරතුර |
| ව්‍යාපෘතිය ක්‍රියාවට නැන්වීම අතරතුර |

**ව්‍යාපාරික අවස්ථාවන්**

| | |
|---|---|
| උපදේශණ සේවාවන් | තීරණය කළ යුතුය |
| ප්‍රසම්පාදනය | තීරණය කළ යුතුය |

වගකිව යුතු නිළධාරී

| | |
|---|---|
| ආ.ස.බැ වගකිව යුතු නිළධාරී | හොෂිනෝ, ටකහා |
| ආ.ස.බැ වගකිව යුතු දෙපාර්තමේන්තුව | දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| ආ.ස.බැ වගකිව යුතු අංශය | පොදු කළමනාකරණය, මූල්‍ය අංශ සහ වෙළෙඳ අංශය, දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| ක්‍රියාවට නැන්වීමේ නියෝජිත ආයතන | **මුදල් අමාත්‍යාංශය**<br>මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ල<br>කොළඹ 01,<br>ශ්‍රී ලංකාව |

කාලසටහන

| | |
|---|---|
| සංකල්ප අනුමත කිරීම | 2017 පෙබරවාරි 15 |
| තොරතුරු සෙවීම | 2017 මාර්තු 20 සිට 2017 මාර්තු 24 |
| කළමණාකරණ සමලෝචන රැස්වීම | 2017 මාර්තු 31 |
| අනුමැතිය | - |
| අවසන් විමර්ශණ මෙහෙවර | - |
| ව්‍යාපෘති දත්ත පත්‍රය අවසන් වරට යාවත්කාලීන කරන ලද්දේ | 2017 පෙබරවාරි 15 |

ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධ සාරාංශගත කරන ලද තොරතුරු ව්‍යාපෘති දත්ත පත්‍රවල අඩංගු වේ. ව්‍යාපෘති දත්ත පත්‍රිකාවක් යනු වැඩ කෙරෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධ වාර්තාවක් බැවින් ඇතැම් තොරතුරු මෙහි පළමු පිටපත් වල ඇතුළත් නොවිය හැකි අතර එකී තොරතුරු ලැබෙන පරිදි ඇතුලත් කරනු ඇත. යෝජිත ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු තාවකාලික සහ ගම්‍යමාන තොරතුරු වේ.

ආසියානු සංවර්ධන බැංකුව විසින් මෙම ව්‍යාපෘති දක්ත පත්‍රයේ සඳහන් තොරතුරු එය භාවිත කරන්නන් සඳහා උපකරණයක් ලෙස භාවිතා කිරීමට කිසිදු සහතිකවීමක් නොමැතිව සපයයි. ආසියානු සංවර්ධන බැංකුව විසින් ඉහළ ගුණත්වයෙන් යුත් අන්තර්ගතයක් සැපයීමට සෑම විටම උත්සහ කරන අතර කිසිදු ආකාරයක වගකීමක් නොමැතිව, ප්‍රකාශිතව හෝ හැඟවීමෙන්, පණ්‍යයීය ආකාරයේ වගකීම් සීමාකම් නොමැතිවීම ඇතුළත්ව, නිශ්චිත අරමුණක් සඳහා ගැළපෙන පරිදි, උල්ලංඝනය නොවන ලෙස තොරතුරු "පෙනෙන පරිදි" සපයයි. මෙවැනි ඕනෑම තොරතුරක නිරවද්‍යතාවය හෝ පරිපූර්ණත්වය පිළිබඳව ආසියානු සංවර්ධන බැංකුව විසින් විශේෂිතව ඕනෑම වගකීමක් සහ පෙනීසිටීමක් සිදුනොකරයි.